**ශීර්ෂය -412 විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 07 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණන කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව රාජ්‍ය අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

-----------------------------

**පුනරාවර්තන වියදම්**

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයට අනුව, පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සහ සහනාධාර හා මාරු කිරීම් වියදම් පිළිවෙලින් රු.102,567,947 ක් හා රු. 545,723 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එම ශේෂ පිළිවෙළින් රු. 99,717,555 ක් හා රු. 541,791 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව එම ශේෂ අතර එකතුව රු. 2,854,324 ක වෙනසක් නිරීක්ෂණය විය. | සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුවීම. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 306,529,798 ක් වුවද, භාණ්ඩාගාර මුද්‍රිතයෙහි සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි එම ශේෂය රු.308,475,016 ක් ලෙස සටහන් කර තිබුණි. එමෙන්ම අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට අනුව එම ශේෂය රු. 1,679,199 ක් වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ වැය ශීර්ෂයෙහි සිදුවූ විවිධ වෙනස්කම් හේතුවෙන් වත්කම් නිවැරදිව වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමේ අපහසුතාවයක් පැවැතුනි. එමනිසා CIGAS වැඩසටහනේ BOS වාර්තාවේ අයිතමයෙන් අයිතමය වටිනාකම් ලෙස ඇතුලත් කර නැත. BOS වාර්තාව 2021 අප්‍රේල් CIGAS SUMMARY මාර්ගයෙන් නිවැරදි කිරීමට සටහන් කර ගත් අතර රු. 1,697,199 ක් ලෙස සඳහන්ව ඇත්තේ 2020.09.01 – 2020.12.31 දක්වා මිලට ගෙන ඇති වත්කම් බව. | අමාත්‍යාංශයට අයත් වත්කම් අයිතමයන් නිවැරදිව හඳුනාගෙන එම වත්කම් ස්ථාවර වත්කම් ලේඛණයෙහි ඇතුලත් කිරීමට කටයුතු කල යුතුවීම. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අත්තිකාරම් ගෙවීම් රු.2,774,886 ක් දක්වා තිබුණත් රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමට අනුව මුදලින් සිදු කරන ලද ගෙවීම් රු. 2,807,661 ක් වී තිබුණි. ඒ අනුව එම ශේෂ අතර රු. 32,775 ක වෙනසක් විය. | සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව සකස් කිරීමට කටයුතු කල යුතුවීම. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අනුව වර්ෂය තුල හර කිරීම් සහ බැර කිරීම් පිළිවෙලින් රු.70,693,549 ක් සහ රු. 6,723,898 ක් වුවත්, අත්තිකාරම් පාලන ගිණුම අනුව එම වටිනාකම පිළිවෙලින් රු. 13,162,216 ක් හා රු.16,548,156 ක් වී තිබුණි. එමෙන්ම කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයට අනුව රු. 26,470 ක හඳුනා නොගත් බැර ශේෂයක් ගලපා සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ගිණුමේ රු. 63,969,651 ක ශේෂය ලබාගෙන තිබුණි. | සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාල නිවැරදි තොරතුරු ඇතුලත් කර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුවීම. |

## 1.6.5 අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ 06 අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවෙහි ඇතුලත් රු. 488,174,336 ක ශේෂය සහ රු. 4,111 ක් වූ මුදල් පොතෙහි ශේෂය අතර වෙනස අග්‍රිම ගැලපුම් ගිණුමක් මගින් සසඳා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවේ ශේෂය හා මුදල් පොතෙහි ශේෂය අග්‍රිම ගැලපුම් ගිණුමක් මගින් සසඳා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කල යුතුවීම. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව භාණ්ඩාගාර අග්‍රිම ශේෂය හා අමාත්‍යාංශ අග්‍රිම ශේෂය අතර රු. 265,913 ක වෙනසක් විය. | සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අග්‍රිම ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සමඟ ගලපා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණු අතර භෞතිකව සහ පරිගණකගතව පවත්වාගෙන ගොස් තිබුණු ලේඛණවල අමාත්‍යාංශය සතු වාහනවල නිවැරදි දත්ත ඇතුලත්ව නොතිබුණි | මින් ඉදිරියට අමාත්‍යාංශ වාහන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය පවත්වාගත යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ වියදම් වෙනුවෙන් රු. 200,167,000 ක අග්‍රිමයක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණ ද රු.211,836,000 ක අග්‍රිමයක් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීම හේතුවෙන් සැලසුම් කල අග්‍රිමය ඉක්මවා රු. 11,669,000 ක අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. සැලසුම් කල අග්‍රිමයෙන් සහ ඉල්ලුම් කළ අග්‍රිමයෙන් පිළිවෙලින් සියයට 66 ක් සහ 62 ක් පමණක් අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. | ඉල්ලුම් කළ අග්‍රිම මුදල්, එම මාසයේ නොලැබුණ විට එම අග්‍රිම මුදල් ඊළඟ මාසයේ ඉල්ලුම් කරනු ලබයි. එවිට ඉල්ලුම් කළ අග්‍රිමය, සැලසුම් කළ අග්‍රිමය ඉක්මවා යාමට පුළුවන් බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සහ අනුමත ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව අමාත්‍යාංශයට අවශ්‍ය අග්‍රිම නිසිපරිදි සැලසුම් කර නියමිත වේලාවට ඉල්ලුම් කිරීමට කටයුතු කල යුතුවීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැය විෂයයන් 18 කට අදාලව රු. 27,450,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 9,893,789 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය එක් එක් වැය විෂයයට අදාලව සියයට 23 සිට සියයට 100 අතර පරාසයක විය. තවද, ප්‍රාග්ධන වැය විෂයයන් 8 ක රු. 4,750,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 3,831,966 ක් හෙවත් සියයට 80 ක් ඉතිරිව තිබූ අතර එම ඉතිරිය එක් එක් වැය විෂයයෙන් සියයට 37 සිට සියයට 100 අතර පරාසයක විය. | අමාත්‍යාංශයේ කාමර වෙන්කළ ආයතනයට ගෙවීමට තිබූ මුදල වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කලද විගණනයේදී හෙළිවූ කරුණු නිසා ගෙවීම් කටයුතු ප්‍රමාද කිරීම ආදී විවිධ හේතු ප්‍රතිපාදන ඉතිරි වීමට බලපා ඇති අතර ඉදිරියේදී අයවැය ඇස්තමේන්තු පිලියෙළ කිරීමේදී අධි ඇස්තමේන්තු ඇතුලත් නොකිරීමට සටහන් කර ගත්බව. | අවශ්‍යතාව නිසි පරිදි පුරෝකථනය කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී විෂයයන් 06 ක් සඳහා මුදල් රෙගුලාසි 66 මගින් එකතුව රු. 4,325,000 ක මුදලක් වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි. එමෙන්ම එම මාරුකිරීම් වලින් වැය විෂයයන් තුනකට අදාලව එකතුව රු. 213,705 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | මාණ්ඩලික මට්ටමේ නිලධාරීන්ට රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සංයුක්ත දීමනා මසකට දින 15ක් අනුමත කළද ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම සහ අනෙකුත් වැය විෂයයන්ගේ ඉතිරිය සියයට 05 ට වඩා අඩු වූ බව. | ප්‍රතිපාදන අවශ්‍යතාව නිස්චිතව හඳුනාගැනීමෙන් පසුව අත්‍යවශ්‍ය වූ වැය දැරීම් සඳහා පමණක් මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන මාරු කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 05 ක් සඳහා ප්‍රතිපාදනය කරතිබූ එකතුව රු. 2,300,000 කින් එකතුව රු. 1,875,000 ක් හෙවත් සියයට 81.5 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි. | 2020 වර්ෂයට අතුරු සම්මත ගිණුම් 04 ක් මගින් ප්‍රතිපාදන ලබාදුන් බැවින් ප්‍රතිපාදන අඩු වැය විෂයයන් වලට ප්‍රතිපාදන මාරු කිරීම සිදුවිය. මින් ඉදිරියට වඩාත් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කරන බව. | අවශ්‍යතාව නිවැරදිව හඳුනා ගෙන වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර වැය කිරීම විධිමත්ව කළමණාකරණය කල යුතුවීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 712,481 ක් වූ බැරකම් හා බැඳීම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර නොතිබුණු අතර වැය විෂයයන් 3 කට අදාලව ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.1,305,428 ක බැරකම් වලට එළඹී තිබුණි. | සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | බැරකම්වලට බැඳීමේදී ඊට අදාල මුදල් රෙගුලාසි විධිවිධාන පිළිබඳ නිසි අවධානය යොමු විය යුතුවීම. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල කටයුතු සීමාවීම සැලසුම් කළ පරිදි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බාධාවක් විය. ඉදිරියේදී එම කටයුතු නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට සටහන් කරගෙන ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල කටයුතු සීමාවීම සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් සිදුකිරීමට බාධාවක්වී තිබීම. | -එම- |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 iv ඡේදය | සමාලෝචිත වර්ෂයේ මාස තුනක සිදු කරන ලද විගණන නියැදි පරීක්ෂාවට අනුව ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් පැමිණීම සනාථ කර ගැනීමකින් තොරව නිලධාරීන් විසිදෙනෙකු වෙත අතිකාල දීමනා සහ නිවාඩු දින වැටුප් ලෙස රු.306,855 ක් ගෙවා තිබුණි | කොවිඩ් 19 වසංගත තත්වය මත කාර්යය මණ්ඩලයේ සෞඛ්‍ය ආරක්ෂිත බව සඳහා ගනු ලැබූ එක් පියවරක් ලෙසට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය 2020 මාර්තු සිට 2021 මාර්තු 22 දින තෙක් ක්‍රියාත්මක නොකරන ලදී. එම කාල පරිච්ඡේදය තුල අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී පැමිණීමේ ලේඛනය පදනම් කර ගන්නා ලද බව. | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | 1992 අගෝස්තු 03 දිනැති අංක 26/92(2) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිලධාරීන්ට වෙන් කළ වාහන හැර අනෙකුත් වාහන වල රාජ්‍ය ලාංඡනය හා අමාත්‍යාංශයේ නම යෙදිය යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහන 15 ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | 2010 ජුලි 09 දිනැති අංක CA/1/1/16/1 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | 2020 වර්ෂයේ මුල් මාස දෙක තුල අමාත්‍යාංශ ලේකම් ඇතුලු නිලධාරීන් තිදෙනෙකු රටවල් 4 ක සිදුකළ නිළ සංචාර සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එම වාර්තාව ඉදිරිපත් කල යුතු ආකාරය හා ඉදිරිපත් කල යුතු සීමාව පිලිබඳ සියලුම අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | විදේශ ගමන් සම්බන්ධයෙන් චක්‍රේල්ඛ උපෙදස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ 6 සහ 7 දෙදින තායිලන්තයේ බැංකොක් හි පැවති වැඩසටහනට අමාත්‍යාංශය වෙනුවෙන් සහභාගී වූ නිලධාරිනියට ආසියානු සංවර්ධන බැංකුව විසින් නවාතැන් හා යැපීම් දීමනා ගෙවීමට නියමිතව තිබුණු අතර අනියම් දීමනා ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කළ ඇ.ඩො. 120 ක් ගෙවා තිබුණි. ඊට අමතරව ඇ.ඩො. 105 ක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති ඇ.ඩො. 105 ක මුදල නැවත අය කර ගැනීම සඳහා එම නිළධාරිනට 2021.08.18 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති බව. | නිළ සංචාර සඳහා විදේශගතවන නිළධාරීන්ට අනුමත දීමනා පමනක් ගෙවීමට කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අය කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව අනුමත ආකෘතියට අනුව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම මුල් මාස 04 සඳහා පමණක් මිලදී ගැනීම් තිබීම අනුව සිදුකර ඇති බවද අනෙකුත් මාස වෙනුවෙන් මිලදී ගැනීම් පිලිබඳ ස්ථිරභාවයක් නොතිබීම අනුව ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම සිදුකර නොමැති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඒ අනුව ප්‍රසම්පාදනයන් කළමණාකරණය කරගත යුතුවීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් එකතුව රු. 82,650 ක් වටිනා ශීතකරණයක් හා හඩ පටිගත කිරීමේ උපකරණයක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතියෙහි ස්ථාවර වත්කම් විශ්ලේෂණය කර ඉදිරිපත් කර නොතිබුණු බැවින් ඉහත වත්කම් එම ආකෘතියට ඇතුලත්ව ඇති බවට තහවුරු කරගත නොහැකි විය. | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු. 82,650 ක් වටිනා ශීතකරණය හා හඩ පටිගත කිරීමේ උපකරණය වත්කම් ලේඛනවල ඇතුලත් කර ඇති බව සහ CIGAS වැඩසටහනේ BOS වාර්තාවට 2021 අප්‍රේල් මාසයේ ඇතුලත් කිරීමට සටහන් කර ගෙන ඇති බව | වත්කම් වාර්තාගත වීමේදී සිදුවී ඇති අඩුපාඩු කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කල යුතුවීම. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 315 හා 880 අනුව රජයේ මුදල් ආදියෙහි භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම හා ඇප තැන්පත් කළ යුතු අමාත්‍යාංශ නිලධාරීන් විසින් අදාල ඇප මුදල් තැන්පත් නොකිරීම පිළිබඳ ගණන්දීමේ නිලධාරියාගේ අවධානය යොමු වී නොතිබුණි. මේ පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයෙන්ද අවධානය යොමු කර තිබුණි. | මු.රෙ. 880 අනුව ඇප තැන්පත් කළ යුතු අමාත්‍යාංශ නිලධාරීන් කවුරුන්ද යන්න අධ්‍යයනය කරමින් පවතින අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කර ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු සිදු කිරීමට සටහන් කරගෙන ඇති බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ප්‍රමාදයකින් තොරව ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිළ සංචාර සඳහා විදේශගතවන නිළධාරීන් විසින් තම සංචාර නිමකර පැමිණීමෙන් පසු ඉදිරිපත්කරන වාර්තාවල ඇතුලත් කරුණු උපයෝගී කර ගෙන විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් සකස් කිරීමට හෝ එම වැඩසටහන් වලින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීමට වැඩපිළිවෙලක් අමාත්‍යාංශය තුල ක්‍රියාත්මක වී නොතිබුණි. | ඉදිරිපත් කරන වාර්තාවන් හි, ඇතුලත් යෝජනා, ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති වැඩසටහන් සකස් කිරීමටත් එම වැඩසටහන් වලින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් , පසු විපරම් කිරීමට වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීමට අදාල අංශ විසින් ක්‍රියාමාර්ග ගත යුතු බව එම අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශය විසින් නිළ විදේශ සංචාර සඳහා වැයකරන මුදලට සරිලන ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවන වැඩපිළිවෙළක් සකස් කළ යුතුවීම. |

## 4 යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් අභ්‍යන්තර විගණකවරයකු, ඇතුළුව නිලධාරීන් 3 දෙනෙකු සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයේ වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 2,085,245 ක් වැය කර තිබුණි. එම ඒකකය විසින් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ විගණන වැඩසටහන් 15 කින් වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර ප්‍රමාණවත් විගණනයක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | වැඩබැලීමේ පදනමින් අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගෙන වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ විගණන වැඩසටහන් 06 ක අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කර ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් සිදුකිරීමට බාධාවක් වී තිබූ බව. | සුදුසුකම්ලත් විගණකවරයෙකු සහ කාර්ය මණ්ඩලයක් ස්ථිර පදනමින් බඳවාගෙන අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන පද්ධතිය අඛණ්ඩව ඇගයීමට ලක්වන පරිදි අභ්‍යන්තර විගණන ඒකකය ශක්තිමත්ව පවත්වාගෙන යා යුතුවීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලය සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 1069 ක් හා 997 ක් වූ අතර පුරප්පාඩු 72 ක් විය. විධායක මට්ටමේ තනතුරු 11 කින් 03 ක් පුරප්පාඩුව පැවතිණි. | විධායක මට්ටමේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට මේ වනවිට කටයුතු සිදුවෙමින් පවතින බවද, ද්විතියික මට්ටමේ සංවර්ධන නිලධාරී පුරප්පාඩු ද මේ වනවිට සම්පූර්ණ වෙමින් පවතින බව. | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් අත්‍යාවශ්‍ය තනතුරු වල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |